පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා - අංක 487

ආයතනයේ නම: අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் :487

நிறுவனத்தின் பெயர்: **நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு**

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

**Parliamentary Series No. 487**

**Name of the Institution: Ministry of Justice National Integration**

**Submission of observations of honorable minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No: 119(4)**

ආකෘති පත්‍ර (අංක 01)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක: 487

ආයතනයේ නම : ආරක්ෂක අමාත්‍යාංශය

| කමිටුව මඟින් දෙනු ලැබූ නිර්දේශ | නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය |
|---|---|
| ශ්‍රී ලංකා මුහුදු සීමාවේ ගමන් කරන නෞකාවලින් අදාළ ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් යෝජිත පනත් කෙටුම්පතේ වර්තමාන තත්වය පිළිබඳ වාර්තාවක් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය විසින් කාරක සභාව වෙත ලබා දීම. | අදාළ පනත් කෙටුම්පත 2024 අංක 7 දරණ ජාතික ජල ශාස්ත්‍රීය පනත වශයෙන් පාර්ලිමේන්තුවේදී සම්මත වී ඇත. (පනතේ පිටපතක් ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.) |

ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය.

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2024 අංක 7 දරන ජාතික ජලශාස්ත්‍රීය පනත

---

**[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 01 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2024 පෙබරවාරි මස 02 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 72.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**2024 අංක 7 දරන ජාතික ජලශාස්ත්‍රීය පනත**

[සහතිකය සටහන් කළේ 2024 පෙබරවාරි මස 01 වන දින]

එල්.ඩී.-ඕ. 36/2023

**1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය යටතේ ශ්‍රී ලංකාවේ යම් නිශ්චිත බැඳියාවන් බලාත්මක කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය පිහිටුවීම; ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරුන් සහ නාවික සිතියම් නිර්මාණ ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

(මේ පනතේ "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියක් 1974 වර්ෂයේ නොවැම්බර් මස 1 වන දින මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවේ දී පිළිගනු ලැබ, 1980 වර්ෂයේ මැයි මස 25 වන දින බලාත්මකභාවයට පත්ව ඇති හෙයින් ද: පූර්විකාව

වර්ෂ 1983 අගෝස්තු මස 30 වන දින 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියට ශ්‍රී ලංකා රජය එකඟ වී ඇති හෙයින් ද:

2019 අංක 17 දරන පනතින් සංශෝධිත 1971 අංක 52 දරන වෙළඳ නැව් පනතින් 1974 මුහුදේ දී ජීවිත ආරක්ෂාව සඳහා වන සම්මුතියට දැනටමත් බලාත්මකභාවයක් ලබා දී තිබුණ ද, ඉහත සඳහන් සම්මුතියේ V වන පරිච්ඡේදයේ 4 වන සහ 9 වන නියෝග සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බැඳීම්වලට බලාත්මකභාවයක් ලබා දීම සඳහා නිශ්චිත නීතිමය විධිවිධාන පැනවීමට අවශ්‍යව ඇති හෙයින් ද:

එම නිසා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** (1) මේ පනත 2024 අංක 7 දරන ජාතික ජලශාස්ත්‍රීය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය සහ බලාත්මක වන දිනය

(2) මේ වගන්තිය හැර, මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

(3) මේ වගන්තියේ විධිවිධාන කෙටුම්පත පාර්ලිමේන්තුවේ පනතක් බවට පත් වන දින සිට බලාත්මක විය යුතු ය.

## I වන කොටස
## ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය පිහිටුවීම

ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය පිහිටුවීම

**2.** (1) (මෙහි මින් මතු "කාර්යාලය" යනුවෙන් හඳුන්වනු ලබන) ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය යනුවෙන් හඳුන්වන කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කාර්යාලය, (1) වන උපවගන්තිය යටතේ ඊට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් කාර්යාලය විසින් ද, කාර්යාලයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කාර්යාලයේ පරමාර්ථ

**3.** කාර්යාලයේ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) සම්මුතිය මගින් නියම කර ඇති පරිදි ජලශාස්ත්‍රීය සේවා සැපයීම සඳහා වගකීම;

(ආ) නැව්වල ආරක්ෂිත නාවික ගමනාගමනය සඳහා නිවැරදි නාවික සිතියම් සකස් කිරීම සහ පවත්වාගෙන යාම සහ ජලගැඹුර, මුහුදු පතුලේ ලක්ෂණ, ජල තීරය, අනතුරු සහ නාවික ගමනාගමනය සඳහා වන උපකාර පිළිබඳ තොරතුරු සැපයීම;

(ඇ) නාවික සිතියම් යාවත්කාලීන කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා දත්ත එක්රැස් කිරීම සහ සමුද්‍රීය සුරක්ෂිතභාවය සහතික කිරීම;

(ඈ) නාවික ගමනාගමනය සඳහා වන ආධාරක ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යාම සහ

නාවිකයන්ට සිය තත්ත්වයන් නිශ්චය කිරීමට සහ විශේෂයෙන් ම අභියෝගාත්මක අවස්ථාවන්හි දී ආරක්ෂිතව නාවික ගමනාගමනයේ යෙදීමට උපකාර කිරීම; සහ

(ඉ) ක්ෂේත්‍රයේ දී භාවිත කරනු ලබන ජලශාස්ත්‍රීය මැනුම් ශිල්පක්‍රම, දත්ත සකස් කිරීමේ ක්‍රම සහ තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම.

**4.** කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :- කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

(අ) සියලුම ආකාරයේ නාවික ගමනාගමන සිතියම්, ප්‍රකාශන සහ ජලශාස්ත්‍රීය සේවා සකස් කිරීමේ, බෙදා හැරීමේ, විකිණීමේ සහ යාවත්කාලීන කිරීමේ කාර්ය සඳහා සමුද්‍රීය භූ අවකාශීය දත්ත එකතු කිරීම, සංරක්ෂණය කිරීම, නියාමනය කිරීම සහ ගොනුකිරීම;

(ආ) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපවල ආරක්ෂිත නාවික ගමනාගමනය සඳහා අවශ්‍ය සියලුම ආකාරයේ නාවික ගමනාගමන සිතියම් පළ කිරීම;

(ඇ) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපවල ජලශාස්ත්‍රීය මැනුම් කටයුතු ක්‍රියාත්මක කිරීම;

(ඈ) රහස්‍යභාවය සහ ජාතික හා කලාපීය ආරක්ෂාව පිළිබඳ සුරක්ෂිතතාව කෙරෙහි බලපෑමක් තිබිය හැකි සමුද්‍රීය දත්ත තබා ගැනීම:

එසේ වුව ද, කාර්යාලය විසින්, සිය මතය අනුව, ජාතික ආරක්ෂාව කෙරෙහි බලපෑමක් ඇති කළ හැකි යම් දත්ත පළ කිරීමට හෝ ප්‍රචාරණය කිරීමට පෙර ආරක්ෂාව පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ එකඟත්වය ලබාගත යුතු ය;

(ඉ) ජාත්‍යන්තර නාවික කටයුතුවල ආරක්ෂාව සහතික කිරීම සඳහා -

(i) ශ්‍රී ලංකාවේ සම්මත කරගන්නා ලද ජාත්‍යන්තරව පිළිගත් ජලශාස්ත්‍රීය ප්‍රමිතීන් සහ පිරිවිතරයන්ට අනුකූලව මැනුම් කටයුතු ප්‍රමාණවත් ලෙස සිදු කිරීම;

(ii) එවැනි පිරිවිතරයන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදන හරහා පළ කිරීම;

(iii) නාවික ගමන් මාර්ග, ප්‍රදීපාගාර, ඔබලිස්ක්, සියලුම වර්ගයේ බෝයාවන් සහ පහන් කණු පිළිබඳ හඳුනාගැනීමේ තොරතුරු සහ වඩදිය බාදිය දත්ත පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් වන පරිදි පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සියලුම වර්ගයේ නාවික සිතියම් සහ නාවික ප්‍රකාශන සකස් කිරීම සහ නිකුත් කිරීම;

(iv) නාවික අනතුරු පිළිබඳ තොරතුරු ඇතුළත් දැන්වීම් සකස් කිරීම සහ ඒවා නාවිකයන් වෙත නිකුත් කිරීම සහ එවැනි අනතුරකට මුහුණ දී ඇති යම් තැනැත්තකු ගලවාගැනීමේ දී සහාය දීම; සහ

(v) යාවත්කාලීන මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික නාවික සිතියම් සහ ප්‍රකාශන සම්බන්ධයෙන් උපදෙස් නිකුත් කිරීම;

(ඊ) නාවික සිතියම් සහ ප්‍රකාශන ජාත්‍යන්තර සම්මුතීන්ට සහ ප්‍රමිතීන්ට අනුකූලව පවත්වාගෙන යාම;

(උ) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපවලට අදාළව නිවැරදි සහ විශ්වසනීය ජලශාස්ත්‍රීය සහ යාත්‍රික තොරතුරු සැපයීම;

(ඌ) ජාත්‍යන්තර සම්මුතීන් සහ ප්‍රමිතීන්ට අනුකූලව ජලශාස්ත්‍රීය මැනුම් කටයුතු සහ නාවික සිතියම් නිර්මාණය පිළිබඳ පුහුණුවීම් පැවැත්වීම;

(එ) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය කලාපවල දී ආරක්ෂාව සහ වෙනත් යාත්‍රික අවශ්‍යතාවන් සහතික කර ගැනීම සඳහා වෙරළ කලාපයේ වඩදිය හා බාදිය නිරීක්ෂණය කිරීම, සටහන් කිරීම සහ වාර්තා සකස් කිරීම සහ ඒවා පළ කිරීම;

(ඒ) නියම කළ හැකි පරිදි ජලශාස්ත්‍රීය මැනුම් කටයුතුවල දී රැස්කර ගන්නා ලද සියලුම දත්ත, සියලුම සමුද්‍රීය දත්ත සහ සියලුම ජල අවකාශීය දත්ත එකතු කිරීම, නියාමනය කිරීම, නිකුත් කිරීම, සංරක්ෂණය කිරීම සහ පවත්වාගෙන යාම;

(ඔ) (i) වෙරළ කළමනාකරණය සහ සංවර්ධනය;

(ii) වරාය කටයුතු පිළිබඳ ශක්‍යතා අධ්‍යයන සහ තක්සේරු කිරීම්, කැණීම් මෙහෙයුම්, නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම;

(iii) වෙරළ ඛාදනය අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම;

(iv) මුහුදෙන් ඉඩම් ගොඩකිරීම සහ කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා ස්ථාන, මුහුදේ ස්ථාපිත කිරීම සහ ඒවා අධීක්ෂණය කිරීම;

(v) පර්යේෂණ පැවැත්වීම සහ ජලජ සම්පත් සංවර්ධනය;

(vi) වෙරළාශ්‍රිත ජල තීරයේ භාණ්ඩ හා මගී ප්‍රවාහන කටයුතු සම්බන්ධ යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

(vii) වෙරළාශ්‍රිත ජල තීරයේ යටිතල පහසුකම් ඉදිකිරීම, ඒවා සංවර්ධනය සහ වෙනත් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම;

(viii) වෙරළාශ්‍රිත කලාපයන්හි සංචාරක හා විනෝදාස්වාද කටයුතු ප්‍රවර්ධනය කිරීම; හෝ

(ix) සමුද්‍රීය දූෂණය වැළැක්වීම සහ ආපදා කළමනාකරණය,

යන කටයුතුවල නිරත වන යම් නියෝජ්‍යායතන, ආයතන හෝ සංවිධාන වෙත, අදාළ ලිඛිත නීතින්ට යටත්ව අවශ්‍ය සහයෝගය ලබා දීම;

(ඕ) ශ්‍රී ලංකා ජල තීරයේ සමුද්‍රීය සීමා ලකුණු කිරීම සම්බන්ධයෙන් සහාය දැක්වීම සහ උපදෙස් ලබා දීම;

(ක) මුහුදු පත්ලෙහි නළ මාර්ග හා රැහැන් පද්ධති ඇතිරීම සහ ඛනිජ නිස්සාරණ ළිං ස්ථාපිත කිරීම ඇතුළු සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් සහ වෙනත් සහාය ලබා දීම සහ එම කටයුතුවලට අදාළ දත්ත සහ තොරතුරු සංරක්ෂණය කිරීම;

(ග) නියමිත අධ්‍යාපනික ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකා ජල තීරයේ ජලශාස්ත්‍රීය සහ සමුද්‍රීය භූ අවකාශීය තොරතුරු අධ්‍යයනයේ නිරත වන වෙනත් අධ්‍යාපනික ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම;

(ච) ජලශාස්ත්‍රය පිළිබඳ උසස් වෘත්තීයමය ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ඇති වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම;

(ජ) ජලශාස්ත්‍රීය මැනුම් කටයුතු සහ නාවික සිතියම් නිර්මාණකරණයට අදාළ උසස් අධ්‍යාපනික පුහුණුවීම් පැවැත්වීම සහ අදාළ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වය ඇති විදේශ ආයතනවල සහයෝගය ඇතිව අවශ්‍ය තාක්ෂණික සහ වෘත්තීයමය පුහුණුවීම් ලබා ගැනීම;

(ට) ශ්‍රී ලංකා ජල තීරයේ යාත්‍රික කටයුතුවල ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා අදාළ අධිකාරීන්ට සහාය

දැක්වීම සහ ශ්‍රී ලංකා ජල තීරයේ ආර්ථික කටයුතු කළමනාකරණය කිරීම සඳහා එම අධිකාරීන්ට අවශ්‍ය සහාය ලබා දීම;

(ඩ) මුදලින් හෝ අන්‍යාකාරයකින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, කාර්යාලය විසින්, කාර්යාලය වෙත කරනු ලබන සියලුම විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය;

(ණ) උචිත යයි සලකනු ලැබිය හැකි පරිදි යම් බැංකුවක යම් ගිණුමක් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම සහ ක්‍රියාත්මක කිරීම;

(ත) කාර්යාලයේ අරමුදල කළමනාකරණය කිරීම, පාලනය, පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම;

(ද) මේ පනතේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන කාර්යාලය සතු මුදල් ප්‍රමාණයන් ආයෝජනය කිරීම;

(න) යම් චංචල හෝ නිශ්චල දේපළක් මිල දී ගැනීම, දැරීම, බද්දට හෝ කුලියට ලබා ගැනීම හෝ ලබා දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ප) කාර්යාලයේ යම් බලයලත් නිලධරයකු හෝ නියෝජිතයකු හරහා ඍජුව හෝ වක්‍රව එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලුම කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට එළඹීම සහ ඉටු කිරීම;

(බ) කාර්යාලයේ කටයුතු පරිපාලනයට අදාළ රීති සකස් කිරීම;

(ම) කාර්යාලය විසින් ලබාදෙන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ අයකිරීම් අයකර ගැනීම;

(ය) කාර්යාලයේ පරමාර්ථ ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි නිලධරයන්, සේවානියුක්තයන් සහ නියෝජිතයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, පාරිතෝෂික ගෙවීම, විනය පාලනය ක්‍රියාත්මක කිරීම හෝ සේවයෙන් පහ කිරීම;

(අඅ) කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත පුහුණුවීම් ලබා දීම;

(ආආ) කාර්යාලයේ කර්තව්‍ය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා කමිටු පත් කිරීම; සහ

(ඇඇ) මේ පනතේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා උපකාරී විය හැකි හෝ ආනුෂංගික විය හැකි වෙනත් සියලු ක්‍රියා සහ දේ සිදු කිරීම.

## II වන කොටස

### කාර්යාලයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය

සභාව වෙත පැවරී ඇති කාර්යාලයේ පරිපාලනය සහ කළමනාකරණය

**5.** (1) කාර්යාලයේ කටයුතු පරිපාලනය සහ කළමනාකරණය (මේ පනතේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ජලශාස්ත්‍රීය සභාව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) සභාව විසින්, මේ පනතේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා යෝග්‍ය වන ආකාරයට කාර්යාලයේ කටයුතු පරිපාලනය කිරීමේ සහ කළමනාකරණය කිරීමේ කාර්යය සඳහා මේ පනත මගින් කාර්යාලය වෙත පවරන ලද, නියම කරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

සභාවේ සංයුතිය

**6.** (1) සභාව -

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වූ සාමාජිකයන්ගෙන්,

එනම් -

(i) ආරක්ෂාව පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(ii) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iii) ධීවර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(iv) විදේශ සබඳතා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අතිරේක ලේකම්වරයකුගේ නිලයට අඩු නොවන නිලයක් දරන ඔහුගේ නියෝජිතයකු;

(v) (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනත ප්‍රකාරව පත් කරනු ලැබූ ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා;

(vi) 1981 අංක 54 දරන ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතන පනත යටතේ පත් කරනු ලැබූ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලයේ සභාපතිවරයා;

(vii) මැනුම්පතිවරයා;

(viii) 1971 අංක 52 දරන වෙළඳ නැව් පනත යටතේ පත් කරනු ලැබූ වෙළෙඳ නැව් අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ix) 1979 අංක 51 දරන ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරිය පනත යටතේ පත් කරනු ලැබූ වරාය අධිපතිවරයා;

(x) 2009 අංක 41 දරන වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව පනත යටතේ පත් කරනු ලැබූ වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(xi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පත් කරනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා හෝ එහි උපසභාපතිවරයා;

(xii) 1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත යටතේ පත් කරනු ලැබූ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සභාපතිවරයා;

(xiii) 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ පත් කරනු ලැබූ සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපතිවරයා;

(xiv) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණ පනත යටතේ පත් කරනු ලැබූ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්; සහ

(xv) 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ පත් කරනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා; සහ

(ආ) යටත් පිරිසෙයින් සුදුසුකම්ලත් එක් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු සහ එක් නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ඇතුළත්ව, (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ජලශාස්ත්‍රය හෝ ජලශාස්ත්‍රයට අදාළ

විෂය ක්ෂේත්‍රයන්හි අධ්‍යයන හෝ වෘත්තීය සුදුසුකම් සහ අත්දැකීම් සහිත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයන් තිදෙනකුගෙන්,

සමන්විත විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ශ්‍රී ලංකා නාවික හමුදාපතිවරයා නිල බලයෙන් පත් වූ සාමාජිකයකු ලෙස පත් කරනු ලබන අවස්ථාවක, එම පත් කිරීම (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ විධිවිධාන යටතේ නාවික නොවන කාර්ය ඉටු කිරීමට අදාළව එම පනත ප්‍රකාරව සිදු කරනු ලැබිය යුතු ය.

**7.** (1) පත් කළ සාමාජිකයන්ගෙන් එක් අයකු අමාත්‍යවරයා විසින් සභාවේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය. සභාවේ සභාපතිවරයා

(2) සභාපතිවරයා විසින්, අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන දින සිට එය බලාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් හේතු දක්වා සභාපතිවරයා සභාපති ධුරයෙන් ඉවත් කළ හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය සභාවේ ඔහු සාමාජිකත්වය දරනු ලබන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවකට පත් වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා තාවකාලිකව සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, සභාපතිවරයා නොමැති කාලය තුළ වෙනත් යම් පත් කළ සාමාජිකයකු එම පත් කළ සාමාජිකයාගේ සාමාන්‍ය කාර්යයන්ට අතිරේකව සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීම සඳහා පත් කරනු ලැබිය හැකි ය.

**8.** යම් තැනැත්තකු - සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට නුසුදුසුකම්

(අ) පාර්ලිමේන්තුවේ හෝ යම් පළාත් සභාවක හෝ යම් පළාත් පාලන ආයතනයක මන්ත්‍රීවරයකු හෝ සභිකයකු වන්නේ නම් හෝ එසේ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මකව පවතින යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට අනාවරණය කරගෙන හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ බලාත්මකව පවතින යම් නීතියක් යටතේ වස්තුභංගත්වයට පත් වූවකු ලෙස හෝ බංකොලොත්භාවයට පත් වූවකු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ, වස්තුභංගත්වයෙන් හෝ බංකොලොත්භාවයෙන් නිදහස් කරනු නොලැබූ තැනැත්තකු වන්නේ නම්;

(ඉ) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වරදක් සම්බන්ධයෙන් සිදුවෙමින් තිබෙන විමර්ශනයකට යටත් වන්නේ නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් පනවන ලද මාස හයකට වඩා වැඩි බන්ධනාගාරගත කිරීමේ සිරදඬුවමක් විඳිමින් සිටින හෝ විඳ ඇති තැනැත්තකු වන්නේ නම්;

(උ) කාර්යාලය විසින් හෝ කාර්යාලය වෙනුවෙන් ඇති කරගන්නා ලද යම් කොන්ත්‍රාත්තුවක් යටතේ යම් අයිතිවාසිකමක් හෝ වරප්‍රසාදයක් දරන හෝ භුක්ති විඳින තැනැත්තකු වන්නේ නම්; හෝ

(ඌ) සභාවේ සාමාජිකයකු වශයෙන් ස්වකීය කර්තව්‍ය ඔහු විසින් ඉටු කිරීමේ දී අහිතකර ලෙස බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවක් ඇත්නම්,

එම තැනැත්තා සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු ලෙස දිගට ම සිටීමට නුසුදුස්සකු විය යුතු ය.

ධුර කාලය

**9.** සභාවේ සෑම පත් කළ සාමාජිකයකු ම ඉල්ලා අස්වීම, මිය යාම හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීම මගින් ඔහු විසින් කලින් ධුරය හිස් කරන්නේ නම් මිස, ඔහු පත් කළ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයක එක් වරකට නොවැඩි තවදුරටත් වූ වාරයක් සඳහා නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම

**10.** (1) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාවේ යම් පත් කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් ලිඛිතව පිළිගනු ලැබූ දින සිට බලාත්මක විය යුතු ය.

(2) පත් කළ යම් සාමාජිකයකු රෝගාතුර වීම, අශක්නුතාවකට පත් වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් තාවකාලිකව ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, 6 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් ඔහු නොමැති කාලය තුළ ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, ඒ සම්බන්ධයෙන් හේතු දක්වා යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත් කළ සාමාජිකයකු, සභාවේ සාමාජිකයකු ලෙස නැවත පත් කිරීම සඳහා හෝ වෙනත් යම් තත්ත්වයකින් සභාව වෙත සේවය කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(4) පත් කළ සාමාජිකයකු මිය ගිය විට, ඉල්ලා අස් වූ විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට, අමාත්‍යවරයා විසින්, 6 වන වගන්තියේ (ආ) ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් එම සාමාජිකයා වෙනුවට තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කළ තැනැත්තා විසින් තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දැරිය යුතු ය.

සභාවේ ගණපූරණය සහ රැස්වීම්

**11.** (1) සභාවේ රැස්වීම්, යටත් පිරිසෙයින් මසකට එක් වතාවක් පැවැත්විය යුතු අතර, සභාවේ රැස්වීමක් සඳහා වන ගණපූරණය සාමාජිකයන් හත් දෙනකු විය යුතු ය.

(2) සභාපතිවරයා සභාවේ සෑම රැස්වීමක ම මුලසුන දැරිය යුතු ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා නොපැමිණි අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන්ගෙන් තෝරා පත් කර ගත් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(3) සභාවේ රැස්වීමක් -

(අ) ඒ රැස්වීම සඳහා නියම කරන ලද ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ ඊට සහභාගි වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයන්ට ඊට සහභාගී වන එක් එක් සාමාජිකයන් එකවර දැකිය හැකි සහ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සම්බන්ධතාවක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) සභාවේ යම් රැස්වීමක දී ඉදිරිපත් වන සියලුම ප්‍රශ්න සඳහා ගනු ලබන තීරණයක් එම රැස්වීමට පැමිණ සිටින බහුතර සාමාජිකයන්ගේ ඡන්දයෙන් තීරණය කළ යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මේ වගන්තියේ පූර්ව විධිවිධානවලට යටත්ව, සභාව විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් එහි කාර්යපටිපාටිය විධිමත් කරනු ලැබිය හැකි ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසා සභාවේ ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු බව

**12.** සභාව විසින්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතිය ද එය නොතකා ක්‍රියා කළ හැකි අතර, සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් එහි සාමාජිකයන් අතර, යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීමේ හේතුව මත ම පමණක් අවලංගු නොවිය යුතු අතර, අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**13.** මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට සහ යම් අනුප්‍රමාණ මත සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

කාර්යාලයේ මුද්‍රාව, ලාංඡනය සහ ධජය

**14.** (1) කාර්යාලයේ මුද්‍රාව, සභාව විසින්, කලින් කලට, නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය.

(2) කාර්යාලයේ මුද්‍රාව, සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කළ හැකි ය.

(3) සභාවේ අනුමතය ඇතිව සහ සභාපතිවරයා සහ සභාවේ තවත් එක් සාමාජිකයකු ඉදිරියේ මිස, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ කාර්යාලයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම අත්සන තැබිය යුතු ය:

එසේ වුව ද, යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට කාර්යාලයේ මුද්‍රාව තබන අවස්ථාවේ සභාපතිවරයාට පැමිණීමට නොහැකි නම්, තත්කාර්ය සඳහා සභාපතිවරයා විසින් ලිඛිතව අවසර ලබාදෙන ලද සභාවේ වෙනත් යම් සාමාජිකයකු මේ උපවගන්තියේ පූර්ව විධිවිධානයට අනුකූලව එම සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් කිරීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(4) කාර්යාලයේ මුද්‍රාව යොදා ඇති සාධන පත්‍ර සහ ලේඛනවල රෙජිස්ටරයක් කාර්යාලය විසින් පවත්වාගෙන යා යුතු ය.

(5) කාර්යාලයේ භාවිතය සඳහා පමණක් ලාංඡනයක් තිබිය යුතු ය.

(6) කාර්යාලයේ අනන්‍යතාව පවත්වා ගැනීම සඳහා ධජයක් තිබිය යුතු ය.

(7) මේ පනත යටතේ කාර්යාලයේ මුද්‍රාව, ලාංඡනය හෝ ධජය දැනුවත්ව හෝ හිතාමතා අනිසි ලෙස භාවිත කරන තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වන ලසු නඩු විභාගයකින් පසු, වරදකරු කරනු ලැබීමෙන් පසු රුපියල් මිලියන දෙකක් නොඉක්මවන දඩයකට හෝ

වසර දෙකකට නොවැඩි බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම යටත් විය යුතු ය.

## III වන කොටස

## ජාතික ජලශාස්ත්‍රඥයා සහ ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ කාර්ය මණ්ඩලය

ජාතික ජලශාස්ත්‍රඥයා පත් කිරීම

**15.** (1) අමාත්‍යවරයා විමසා සභාව විසින් ජාතික ජලශාස්ත්‍රඥයකු කාර්යාලය සඳහා පත් කළ යුතු ය.

(2) ජාතික ජලශාස්ත්‍රඥයා ලෙස පත් කළ තැනැත්තා -

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ආ) ශාරීරිකව හා මානසිකව මනා යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය;

(ඇ) (i) ජලශාස්ත්‍රීය මැනුම් කටයුත්තක වෘත්තීයමය ක්‍රියාකාරකම් සම්බන්ධයෙන්;

(ii) ජලශාස්ත්‍රීය ව්‍යාපෘති කළමනාකරණය සම්බන්ධයෙන්; සහ

(iii) නාවික සිතියම් නිර්මාණකරණය සම්බන්ධයෙන් මනා අවබෝධයක් සහිත,

ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු ලෙස යටත් පිරිසෙයින් වසර පහළොවක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද සහිත තැනැත්තකු විය යුතු ය;

(ඈ) පත් වීමේ දිනට වයස අවුරුදු පනස්පහට නොවැඩි විය යුතු ය; සහ

(ඉ) ශක්නුවත්, උසස් සදාචාරාත්මක අවංකකමින් යුතු සහ හොඳ කීර්තිමත් තැනැත්තකු විය යුතු ය.

(3) ජාතික ජලශාස්ත්‍රඥයා මියයාම, නීතිය ක්‍රියාත්මක වීම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් තම ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, ඔහු එම ධුරයෙන් ඉවත් කරනු ලබන්නේ නම් මිස, අනුගාමී හෝ අන්‍යාකාරයකින් තුන් වතාවක උපරිම ධුර කාලසීමාවකට යටත්ව නැවත පත් වීම සඳහා සුදුසුකම් ලබන්නේ ය.

(4) ජාතික ජලශාස්ත්‍රඥයා, සභාවේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව -

(අ) කාර්ය මණ්ඩලය පරිපාලනය සහ පාලනය ඇතුළුව කාර්යාලයේ එදිනෙදා පරිපාලනමය කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු ය;

(ආ) සභාවේ සියලුම තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය; සහ

(ඇ) සභාව විසින් ඔහුට පවරනු ලැබිය හැකි සියලු කර්තව්‍යයන් ඉටු කළ යුතු ය.

(5) ජාතික ජලශාස්ත්‍රඥයා සභාවේ ලේකම්වරයා විය යුතු අතර, සභාවේ යම් රැස්වීමකට සහභාගි වීමට සහ කතාකිරීමට හිමිකමක් ඇති නමුත්, එවැනි රැස්වීමක දී ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලැබිය යුතු ය.

(6) ජාතික ජලශාස්ත්‍රඥයා විසින්, සභාවේ අනුමතය ඇතිව, (4) වන උපවගන්තියේ සඳහන් ඔහුගේ කර්තව්‍යයන්ගෙන් කුමන හෝ කර්තව්‍ය ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක, කාර්යාලයේ යම් නිලධරයකුට හෝ සේවානියුක්තයකුට ලිඛිතව පවරනු ලැබිය හැකි අතර, එම කර්තව්‍ය පවරනු ලැබූවේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකුට ද එකී නිලධරයා හෝ සේවානියුක්තයා විසින්, ජාතික ජලශාස්ත්‍රඥයාගේ විධානයන්ට යටත්ව ඒවා ඉටු කරනු ලැබිය යුතු ය.

(7) සභාව විසින් ජාතික ජලශාස්ත්‍රඥයා -

(අ) ඔහුගේ කාර්ය ඉටු කිරීමට ස්ථිරව අපොහොසත් තත්ත්වයට පත්ව ඇත්නම්;

(ආ) සභාව විසින් තීරණය කර ඇති පරිදි වංචනික හෝ නීති විරෝධී ස්වභාවයෙන් යුතු යම් ක්‍රියාවක් හෝ කාර්යාලයේ යහපතට අගතියක් වන යම් ක්‍රියාවක් ඔහු විසින් සිදු කර ඇත්නම්; හෝ

(ඇ) සභාව විසින් නිකුත් කරන ලද යම් විධානයකට අනුගත වීමට ඔහු අපොහොසත් වී ඇත්නම්,

ඔහු සිය ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(8) ජාතික ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයාට මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

කාර්යාලයේ කාර්ය මණ්ඩලය

**16.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් සහ සේවානියුක්තයන් සේවයේ යෙදවීම හෝ පත් කිරීම කාර්යාලය විසින් කළ හැකි ය.

(2) පනතේ විධිවිධානවලට යටත්ව -

(අ) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් සම්බන්ධයෙන් විනය පාලනය ක්‍රියාත්මක කිරීමට සහ සේවයෙන් ඉවත් කිරීමට;

(ආ) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද කාර්යාලයේ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි නිශ්චය කිරීමට; සහ

(ඇ) මුදල් විෂයය පවරනු ලැබූ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එම නිලධරයන්ට සහ

සේවානියුක්තයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික නියම කිරීමට,

බලය තිබිය යුතු ය.

(3) කාර්යාලයේ සියලුම නිලධරයන් සහ සේවානියුක්තයන් විසින්, සේවයේ යොදවා මාසයක් ඇතුළත, ඔවුන්ගේ සමීප ඥාතීන්ගේ සම්බන්ධතා ඇතුළු කාර්යාලයේ කටයුතු සහ ගනුදෙනු සම්බන්ධයෙන් වන ඔවුන්ගේ ඍජු හෝ වක්‍ර සම්බන්ධතා හෝ එකී නිලධරයාට හෝ සේවානියුක්තයාට සැලකිය යුතු සම්බන්ධතාවක් ඇති කරුණු සම්බන්ධයෙන් කාර්යාලයට ලිඛිතව ප්‍රකාශ කළ යුතු ය.

(4) මුදල් විෂයය පවරනු ලැබූ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ජාතික ජලශාස්ත්‍රඥයාගේ සහ එහි නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ සහ ඔවුන්ගේ යැපෙන්නන්ගේ සහ නාමිකයන්ගේ යහපත සඳහා කාර්යාලය විසින්, විශ්‍රාම වැටුප් සහ අර්ථසාධක අරමුදල් සහ යෝජනා ක්‍රම ස්ථාපිත කර නියාමනය කරනු ලැබිය හැකි අතර, එවැනි අරමුදලකට හෝ යෝජනා ක්‍රමයකට දායක විය හැකි ය.

(5) කාර්යාලය විසින්, එහි නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ පුහුණුවීම් ප්‍රවර්ධනය කිරීම සහ ඒවාට අනුග්‍රහය ලබාදීම කළ යුතු අතර, මේ කාර්යය සඳහා කාර්යාලය විසින් නිශ්චය කරන ලද කුසලතාව දක්වා ඇති කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන්, ශ්‍රී ලංකාවේ දී හෝ විදේශ රටක දී සිදු කරන අධ්‍යයනයන් සඳහා යන වියදම් ගෙවීම සඳහා කාර්යාලය වෙත බලය පවරනු ලැබිය යුතු ය.

(6) කාර්යාලයේ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට අදාළ වන ආචාර ධර්ම පද්ධතියක් කාර්යාලය විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

(7) යම් තැනැත්තකු -

(අ) අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් විසින් බරපතළ විෂමාචාරයක් සම්බන්ධයෙන් කලින් වරදකරුවකු වී ඇති හෝ නියාමන ආයතනයක් විසින් ගනු ලබන විනය ක්‍රියාමාර්ගයකට යටත්ව සිටි;

(ආ) කලින් ධුරයෙන් පහ කර ඇති; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද නියෝග හෝ රීති කඩ කිරීමක් සිදු කර ඇති,

අවස්ථාවක, කාර්යාලය විසින්, (1) වන උපවගන්තිය යටතේ එවැනි තැනැත්තකු කාර්යාලයේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(8) කාර්යාලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව, කාර්යාලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(9) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(10) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(11) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීමට එකඟ වී ඇති තැනැත්තකු කාර්යාලය විසින් සේවයේ යොදවනු ලබන අවස්ථාවක, එම තැනැත්තා කාර්යාලයේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුම යටතේ බැඳීම් ඉටු කිරීම සඳහා රජයට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(12) කාර්යාලයේ ඉල්ලීම මත, අවස්ථාවෝචිත පරිදි, (357 වන අධිකාරය වූ) යුද්ධ හමුදා පනතේ, (358 වන අධිකාරය වූ) නාවික හමුදා පනතේ සහ (359 වන අධිකාරය වූ) ගුවන් හමුදා පනතේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යම් නිලධරයකු, අවස්ථාවෝචිත පරිදි, යුද්ධ හමුදාපතිවරයාගේ, නාවික හමුදාපතිවරයාගේ හෝ ගුවන් හමුදාපතිවරයාගේ ලිඛිත අවසරය ඇතිව කාර්යාලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය.

(13) කාර්යාලය විසින්, යම් නිලධරයකුගේ හෝ සේවානියුක්තයකුගේ කැමැත්ත ඇතිව, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත වෙනත් රජයේ ආයතනවලට හෝ නියාමන අධිකාරීන්ට, එම ආයතනය හෝ අධිකාරිය, කාර්යාලය සමඟ එකඟ වූ පැවරීමක් මත කාර්යාලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා කාර්යාලයේ නිලධරයන් හෝ සේවානියුක්තයන් ද්විතීයනය කිරීමට යෝජනා කරනු ලැබිය හැකි ය. ද්විතීයනය කරන ලද එම කාලසීමාව කාර්යාලයේ සේවය කරන ලද කාලසීමාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

## IV වන කොටස

## ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයන් හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පීන් ලෙස ලියාපදිංචි වීම

**17.** (1) යම් තැනැත්තකු මේ පනතේ 18 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි වී ඇත්නම් මිස, එම තැනැත්තා විසින් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු ලෙස හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ලෙස වෘත්තියේ නියැලීම නොකළ යුතු ය:

මේ පනත යටතේ ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයන් හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පීන් ලෙස ලියාපදිංචි විය යුතු බව

එසේ වුව ද, මේ පනත බලාත්මක වන දිනයේ දී ශ්‍රී ලංකා අභ්‍යන්තර ජල තීරයේ හැර වෙනත් ජල තීරයන්වල ජලශාස්ත්‍රීය මැනුම් කටයුතුවල හෝ නාවික සිතියම් නිර්මාණකරණයේ නියැලෙන

යම් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු මේ පනත බලාත්මක වූ දින සිට වසර දෙකක් ඇතුළත 18 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන යම් තැනැත්තකු, මේ පනත යටතේ වරදක් සිදු කරන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීම

**18.** (1) ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ලෙස වෘත්තියේ නියැලීමට අපේක්ෂා කරන තැනැත්තකු විසින්, ලියාපදිංචි වීම සඳහා කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්කරුට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නියම කරනු ලැබිය හැකි සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ වන ඉල්ලීමක්, සාරානුකූලව නියෝගය මගින් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් තිබිය යුතු අතර, නියමිත ගාස්තුවක් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(4) කාර්යාලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි ඉල්ලීමකට අදාළ වැඩිදුර තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඉල්ලුම්කරුවකුට නියම කළ හැකි ය.

(5) ඉල්ලීමක් සනාථ කිරීමට ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍යායනය කිරීමට අදාළව දරනු ලබන වියදම ඉල්ලුම්කරු විසින් දැරිය යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු, කාර්යාලය විසින්, ඉල්ලීමේ ඇතුළත් කරුණු සලකා බලා, මේ පනතේ විධිවිධානවලට සහ එහි නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව, ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ලෙස ලියාපදිංචි කිරීම හෝ එමගින් වාර්තා කළ යුතු හේතු දක්වා ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ලෙස ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

(7) කාර්යාලය විසින්, ස්වකීය තීරණය පිළිබඳ ඉල්ලුම්කරුට ලිඛිතව දැන්විය යුතු අතර, ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එකී තීරණය දන්වනු ලැබූ දින සිට මාසයක් ඇතුළත ප්‍රතික්ෂේප කිරීමට හේතු දැක්විය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ ලියාපදිංචි ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු වෙත (මෙහි මින් මතු "ලියාපදිංචි කිරීමේ සහතිකය" යනුවෙන් සඳහන් කරනු ලබන) අදාළ ක්ෂේත්‍රයේ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයට ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(9) ලියාපදිංචි කිරීම ප්‍රදානය කරනු ලැබුවේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද එකී නියම හා කොන්දේසි, ලියාපදිංචි කිරීමේ සහතිකයේ ඇතුළත් විය යුතු ය.

ලියාපදිංචි කිරීමේ කාලසීමාව

**19.** (1) මේ පනත යටතේ ප්‍රදානය කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක් කලින් අවලංගු කරනු ලැබුවහොත් මිස, ලියාපදිංචි සහතිකය නිකුත් කරනු ලැබූ දින සිට වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය.

(2) ලියාපදිංචි කිරීමේ සහතිකය දරන්නා විසින් පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග හෝ එකී ලියාපදිංචි කිරීමේ සහතිකයේ නියම හා කොන්දේසිවලින් යමක් උල්ලංඝනය කර ඇති බවට කාර්යාලය විසින් සෑහීමකට පත් වන්නේ නම් කාර්යාලය විසින්, 18 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය අවලංගු කරනු ලැබිය හැකි ය.

ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම

**20.** 18 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකයක්, නියම කරනු ලැබිය හැකි ආකෘතියකට තත්කාර්ය සඳහා කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මගින් ලියාපදිංචි කිරීමේ සහතිකයේ කාලය අවසන් වීමට දින තිහකට පෙර අලුත් කරනු ලැබිය යුතු අතර, නියම කරනු ලැබිය හැකි ගාස්තුවක් ඒ සමඟ ඉදිරිපත් කළ යුතු ය:

එසේ වුව ද, රජයේ නිලධරයකු වන යම් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකුට හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකුට එම නිලධරයා රජයේ නිලධරයකු ලෙස සේවය කරන තාක් කල් මේ

වගන්තිය යටතේ ලියාපදිංචිය අලුත් කිරීම නියම කරනු නොලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම

**21.** (1) ලියාපදිංචි කිරීම සඳහා හෝ ලියාපදිංචි කිරීමේ සහතිකයක් අලුත් කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී, කාර්යාලය විසින්, පහත දැක්වෙන කවර හෝ හේතුවක් මත ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම ප්‍රතික්ෂේප කළ හැකි ය:-

(අ) තත්කාර්ය සඳහා සාදනු ලැබූ රීතීන්ට අනුකූල නොවීම;

(ආ) මේ පනතේ විධිවිධානවලට හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග හෝ රීතීන්ට අනුකූල වීමට අපොහොසත් වීම;

(ඇ) ඉල්ලුම්කරු විසින් කාර්යාලය වෙත සපයන ලද තොරතුරු හෝ ලේඛන අසත්‍ය හෝ නොමඟ යවන සුලු වීම හෝ කරුණු බැහැර කිරීම්වලින් යුක්ත වීම; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන යටතේ වරදකට වරදකරු කරනු ලැබීම.

(2) කාර්යාලය විසින්, ඉල්ලුම්කරුට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබා නොදී ලියාපදිංචි කිරීම හෝ ලියාපදිංචි කිරීමේ සහතිකය අලුත් කිරීම ප්‍රතික්ෂේප කරනු නොලැබිය යුතු ය.

සංක්ෂිප්ත තනතුරු නාම භාවිතය

**22.** (1) 18 වන වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති, අවස්ථාවෝචිත පරිදි, සෑම ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකුට ම හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකුට ම -

(අ) ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු නම්, "HyS" යන සංක්ෂිප්ත තනතුරු නාමය; සහ

(ආ) නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු නම්, "NauC" යන සංක්ෂිප්ත තනතුරු නාමය,

භාවිත කිරීමේ අයිතිය තිබිය යුතු ය.

(2) යම් තැනැත්තකු මේ පනතේ විධිවිධාන යටතේ ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු ලෙස ලියාපදිංචි වී ඇත්නම් මිස, එම තැනැත්තා විසින්, (1) වන උපවගන්තියේ සඳහන් යම් සංක්ෂිප්ත තනතුරු නාමයක් භාවිත නොකළ යුතු ය.

ලියාපදිංචි කිරීමක් අවලංගු කිරීම හෝ අත්හිටුවීම

**23.** (1) යම් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු විසින් -

(අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන යම් නියෝගයක් හෝ රීතියක් කඩ කර ඇති බවට;

(ආ) 18 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයේ යම් නියමයක් හෝ කොන්දේසියක් කඩ කර ඇති බවට; හෝ

(ඇ) 26 වන වගන්තිය යටතේ කාර්යාලය විසින් පිහිටුවනු ලැබූ පැමිණිලි විසඳීමේ කමිටුව විසින් පවත්වනු ලැබූ පරීක්ෂණයකට පසු, නියමිත ක්‍රියාවකට හෝ වෘත්තීය විෂමාචාරයකට වරදකරු වී ඇති බවට,

කාර්යාලය විසින් සෑහීමකට පත් වන අවස්ථාවක දී, කාර්යාලය විසින් 18 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකුගේ හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකුගේ ලියාපදිංචිය අත්හිටුවීමට පියවර ගනු ලැබිය යුතු අතර, එම අත්හිටුවීම පිළිබඳව එකී ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයා හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියා වෙත වහාම දැන්වීමක් නිකුත් කිරීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) එවැනි යම් දැන්වීමක, කාර්යාලයේ තීරණය පදනම් වන්නේ කුමන හේතුන් මත ද යන වග නිශ්චිතව දැක්විය යුතු අතර, එම ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයා හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියා විසින් දැන්වීම ලැබුණු දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත, ලියාපදිංචිය අවලංගු නොකිරීමට හේතු ලිඛිතව කාර්යාලයට ඉදිරිපත් කළ හැකි බව එම දැන්වීමෙහි දැක්විය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, එම ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයා හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියා විසින් මාසයක කාලසීමාවක් ඇතුළත හේතු ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ විට හෝ ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයා හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියා හෝ විසින් දෙන ලද හේතු පිළිබඳව කාර්යාලය සෑහීමකට පත් නොවන අවස්ථාවක දී, කාර්යාලය විසින්, නිසි පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු, අවස්ථාවෝචිත පරිදි, එම ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයාගේ හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියාගේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි අතර, එම අවලංගු කිරීම පිළිබඳ එම තැනැත්තාට ලිඛිතව දැනුම් දෙනු ලැබිය හැකි ය.

(4) යම් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු මේ පනත යටතේ වරදකට වරදකරු කරනු ලබන අවස්ථාවක දී, 18 වන වගන්තිය යටතේ එම තැනැත්තාට නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ සහතිකය -

(අ) වරදකරු කිරීමට එරෙහිව කිසිදු අභියාචනයක් ඉදිරිපත් නොවුණු අවස්ථාවක දී අවලංගු කළ යුතු ය; හෝ

(ආ) අදාළ ලිඛිත නීතිය ප්‍රකාර අභියාචනයක් ඉදිරිපත් වූ අවස්ථාවක දී, අභියාචනය ඉදිරිපත් කරනු ලැබූ අභියාචනාධිකරණයේ තීරණය ප්‍රකාශ කරන තෙක් අත්හිටුවනු ලැබිය යුතු ය.

(5) ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකුගේ හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකුගේ ලියාපදිංචිය අවලංගු කරනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තාගේ නම, මේ පනතේ 38 වන වගන්තිය යටතේ තබා ඇති රෙජිස්ටරයන්ගෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරන ලද යම් තැනැත්තකු විසින් දින දාහතරක් ඇතුළත ඔහුට අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකය කාර්යාලයට භාරදිය යුතු ය.

## V වන කොටස
## අභියාචනා

**24.** (1) 23 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ හැර, කාර්යාලයේ තීරණයක් මගින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, එකී තීරණය දැනුම් දී දින තිහක කාලයක් ඇතුළත 25 වන වගන්තිය යටතේ තත්කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ අභියාචනා මණ්ඩලය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය. අභියාචනා

(2) අදාළ කරුණු සියල්ල සලකා බැලීමෙන් පසු සහ උචිත හා සාධාරණ අවස්ථාවක, අභියාචනා මණ්ඩලය විසින් -

(අ) අභියාචනයට අවසර ලබා දී, කාර්යාලයේ තීරණය වෙනස් කිරීම හෝ එකී තීරණය තහවුරු කිරීම හෝ කළ හැකි ය; හෝ

(ආ) අභියාචනයට අවසර ලබා නොදිය හැකි ය.

**25.** (1) අමාත්‍යවරයා විසින් - අභියාචනා මණ්ඩලය

(අ) යටත් පිරිසෙයින් වසර පහක පළපුරුද්ද සහිත ලියාපදිංචි ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු සහ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකුගෙන්;

(ආ) අදාළ ක්ෂේත්‍රය පිළිබඳ යටත් පිරිසෙයින් වසර දහයක පළපුරුද්ද සහිත සමුද්‍රීය නීති ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් නීතිඥවරයකුගෙන්; සහ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ නිලධරයකුගෙන්,

සමන්විත අභියාචනා මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් පත් කරනු ලබන අවස්ථාවේ දී, කාර්යාලයේ අදහස් විමසනු ලැබිය හැකි ය.

(3) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන් විසින්, ඔවුන් සාමාජිකයන් ලෙස පත් කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක්

සඳහා ධුර දැරිය යුතු අතර, නැවත පත් කිරීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, අභියාචනා මණ්ඩලයේ රැස්වීම් සහ කටයුතු සිදු කරන ආකාරය නියම කරමින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(5) අභියාචනා මණ්ඩලය විසින් ස්වකීය තීරණය කාර්යාලයට දැනුම් දිය යුතු ය.

(6) අභියාචනා මණ්ඩලයේ තීරණය ලැබීමෙන් පසු, කාර්යාලය විසින් වහාම එකී තීරණය අභියාචකට දැනුම් දිය යුතු අතර, අභියාචනා මණ්ඩලයේ තීරණයට අනුව ක්‍රියා කළ යුතු ය.

(7) අභියාචනා මණ්ඩලයේ සාමාජිකයන්ට, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

පැමිණිලි විසඳීමේ කමිටුව විසින් කරනු ලබන පරීක්ෂණය

**26.** (1) වෘත්තීය විෂමාචාර පිළිබඳ හෝ මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝග හෝ රීති කඩ කිරීමක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිලි විභාග කිරීම සඳහා කාර්යාලය විසින් බලය ලබාදෙන නිලධරයන්ගෙන් සමන්විත (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) පැමිණිලි විසඳීමේ කමිටුවක් කාර්යාලය විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කමිටුව විසින්, අවශ්‍ය හෝ යෝග්‍ය යයි සලකනු ලබන පරීක්ෂණ පවත්වනු ලැබිය හැකි අතර, එකී කාර්යය සඳහා සාක්ෂි දීමට හෝ එම පරීක්ෂණයන්හි කාර්යය සඳහා නියම කරනු ලබන යම් තැනැත්තකු සන්තකයේ ඇති හෝ පාලනයේ ඇති යම් පොතක් හෝ ලේඛනයක් ඉදිරිපත් කිරීමට හෝ එකී තැනැත්තාට සිතාසි යැවීම හෝ ඔහු කැඳවීම කරනු ලැබිය හැකි ය.

(3) කාර්යාලය විසින්, එවැනි පැමිණිලි සහ ඒවාට ආනුෂංගික සියලු කරුණු හැසිරවීම සඳහා මේ පනත යටතේ සාදනු ලැබූ රීති මගින් සුදුසු කාර්යපටිපාටියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(4) යම් තැනැත්තකු විසින් කරන ලද ලිඛිත පැමිණිල්ලක් ලැබීමෙන් පසු, කමිටුව විසින්, යම් පැමිණිල්ලක් ඉදිරිපත් කරනු ලැබුවේ යම් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකුට හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකුට එරෙහිව ද එකී ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයා හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියා හෝ විසින් යම් නිශ්චිත වෘත්තීය විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇත්දැයි සොයා බැලීමට කමිටුව වෙත ඉදිරිපත් කරන ලද සාක්ෂි පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(5) යම් තැනැත්තකු විසින්, මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදනු ලැබූ නියෝගයක් හෝ රීතියක් කඩ කර ඇති බව කමිටුව විසින් සොයාගනු ලබන අවස්ථාවක දී, කමිටුව විසින්, එකී සොයා ගැනීම නිර්දේශයක් සමඟ කාර්යාලය වෙත පැවරිය යුතු අතර, එම නිර්දේශය බලාත්මක කිරීමේ හෝ කාර්යාලය විසින් යෝග්‍ය යයි සලකනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමේ හෝ අභිමතය කාර්යාලය සතු විය යුතු ය.

(6) එම තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා නොදී කාර්යාලය විසින් මේ වගන්තිය යටතේ යම් ක්‍රියාමාර්ගයක් නොගත යුතු ය.

## VI වන කොටස

## මුදල්

**27.** (1) කාර්යාලයට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහිම අරමුදලක් තිබිය යුතු ය. කාර්යාලයේ අරමුදල

(2) (අ) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කලට, වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්;

(ආ) මේ පනත යටතේ කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කාර්යාලයට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව කුමන හෝ යම් මූලාශ්‍රයකින් ආදායම්, ගාස්තු, අයකිරීම්, ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලෙස කාර්යාලයට ලැබිය හැකි සියලු මුදල් ප්‍රමාණයන්,

අරමුදලට බැර කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කාර්යාලය විසින්, කාර්යාලය වෙත කරන ලද සියලු විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු ය.

(3) (අ) මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී, කාර්යාලය විසින් දරන ලද යම් වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ මේ පනත යටතේ අරමුදලින් ගෙවනු ලැබීමට අවශ්‍ය සියලු මුදල්,

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

මුදල් වර්ෂය සහ ගිණුම් විගණනය

**28.** (1) කාර්යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සභාව විසින්, කාර්යාලයේ ආදායම් සහ වියදම්, වත්කම් සහ වගකීම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනයට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කාර්යාලයේ ගිණුම් විගණනය සඳහා අදාළ විය යුතු ය.

(4) සභාව විසින්, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය විගණකවරයාගේ වාර්තාව සමඟ, එකී වාර්තාව අදාළ වන මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස පහක් ඇතුළත අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අමාත්‍යවරයා විසින් එකී ප්‍රකාශය සහ වාර්තාව ලැබීමෙන් පසු මාස දෙකක් ඇතුළත ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

## VII වන කොටස

### සාමාන්‍ය

සභාවේ බලතල පැවරීම

**29.** (1) සභාව විසින්, ලිඛිතව සහ එහි නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, 16 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ සභාව වෙත පවරා ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ජාතික ජලශාස්ත්‍රඥයා වෙත පවරනු ලැබිය හැකි අතර, ජාතික ජලශාස්ත්‍රඥයා විසින් එකී බලතල, කාර්ය සහ කර්තව්‍ය සභාවේ නමින් සහ සභාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කළ යුතු ය.

(2) සභාව විසින්, (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද කිසිදු පැවරීමක් නොතකා, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය එය විසින් ම ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කළ හැකි අතර, එවැනි යම් බලය පැවරීමක් යම් අවස්ථාවක දී ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.

මේ පනත යටතේ ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා ආරක්ෂාව

**30.** මේ පනත යටතේ අවස්ථාවෝචිත පරිදි, කාර්යාලයේ හෝ සභාවේ විධාන මත කාර්යාලයේ ජාතික ජලශාස්ත්‍රඥයා, යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු හෝ සභාවේ යම් සාමාජිකයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සඳහා, ඔහු සද්භාවයෙන් ක්‍රියා කළ බවට සහ නිසි උද්‍යෝගයෙන්, සාධාරණ සැලකිල්ලෙන් සහ කුසලතාවෙන් කටයුතු කළ බවට ඔහු විසින් ඔප්පු කරනු ලබන්නේ නම්, ඔහුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක් පවරනු නොලැබිය යුතු ය.

රහස්‍යභාවය පවත්වාගෙන යාමේ වගකීම

**31.** (1) සභාවේ සෑම සාමාජිකයකු, කාර්යාලයේ ජාතික ජලශාස්ත්‍රඥයා සහ සෑම නිලධරයකු හෝ සේවානියුක්තයකු විසින් ම, තම ධුරයේ කාර්ය ආරම්භ කිරීමට පෙර, මේ පනත යටතේ තම බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී තමා වෙත ලැබුණු හෝ තමාට දැනගැනීමට ලැබුණු යම් තොරතුරු 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ අවසර ලබා දෙන ප්‍රමාණයට මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා හැර, හෙළිදරව් නොකරන බවට වන ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන කඩ කරන යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදට වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ වසරකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයකින් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

දත්ත සමුදාය

**32.** (1) කාර්යාලය විසින් එකතු කරන ලද සියලුම ජලශාස්ත්‍රීය මැනුම් දත්ත, සමුද්‍රීය දත්ත සහ ජල අවකාශීය දත්ත ඇතුළත් දත්ත සමුදායක් කාර්යාලය විසින් නිර්මාණය කර, පාලනය කර පවත්වාගෙන යා යුතු ය.

(2) කාර්යාලය විසින්, එහි සියලු දත්ත සමුදායන්හි සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන තාක්ෂණික ආරක්ෂණ පියවර ඇතුළු අවශ්‍ය සියලු පියවර ගනු ලැබිය යුතු ය.

අනුපිටපත්

**33.** (1) කලින් මාසය තුළ, සෑම ලියාපදිංචි ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු විසින් පිළියෙල කරන ලද සියලු නාවික සිතියම් සහ නාවික ප්‍රකාශනවල අනුපිටපත්, නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකින් සහ ආකාරයකින් පිටපත් දෙකකින් යුතු ලැයිස්තුවක් ද සමඟ සෑම මසකම පහළොස් වන දිනයේ දී හෝ එදිනට පෙර කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) කාර්යාලය විසින් එකී අනුපිටපත් නියම කරනු ලැබිය හැකි ආකෘතියෙන් සහ ආකාරයෙන් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) යම් මාසයක් සඳහා යම් නාවික සිතියමක් හෝ දළ සටහන් පත්‍රයක් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු විසින් පිළියෙල කරනු නොලබන අවස්ථාවක දී, එකී තැනැත්තා විසින්, ඔහු ශ්‍රී ලංකාවෙන් බැහැර වී සිටින්නේ නම් මිස, එම මාසය සඳහා හිස් ලැයිස්තුවක් අනුගාමී මාසයේ පහළොස් වන දිනයේ දී හෝ ඊට පෙර ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) අනුපිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු හෝ නාවික සිතියම් නිර්මාණ ශිල්පියකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ වෘත්තීය විෂමාචාරයක් සිදු කරනු ලබන්නේ ය.

නාවික සිතියම් ආදියේ සත්‍යතාව

**34.** යම් නාවික සිතියමක හෝ දළ සටහන් පත්‍රයක සත්‍ය පිටපතක් යයි කියනු ලබන සහ ජාතික ජලශාස්ත්‍රඥයා හෝ ඔහු වෙනුවට ක්‍රියා කරන යම් නිලධරයකු විසින් අත්සන් කරන ලදැයි කියනු ලබන වෙනත් යම් ලිඛිත නීතියකට අනුකූලව සකස් කරන ලද එවැනි නාවික සිතියමක්, දළ සටහන් පත්‍රයක් හෝ වෙනත් යම් නාවික ගමනාගමන සිතියමක් හෝ ජලශාස්ත්‍රීය මිනුම් සටහන් පත්‍රයක්, සියලු නඩු කටයුතුවල දී සහ සියලු කාර්යයන් සඳහා සාක්ෂිවල දී පිළිගනු ලැබිය යුතු අතර, එහි සඳහන් කරුණුවල සත්‍යතාව සම්බන්ධයෙන් බැලූබැල්මට පෙනෙන සාක්ෂියක් වශයෙන් ගත යුතු අතර, පටහැනි බවට ඔප්පු කරන තෙක් එකී පිටපත ජාතික ජලශස්ත්‍රඥයා හෝ ඔහු වෙනුවට ක්‍රියාකරන නිලධරයා විසින් සත්‍ය වශයෙන් ම අත්සන් කරනු ලැබූ හෝ සත්‍යතාව තහවුරු කරනු ලැබූ බව හෝ එය සත්‍ය පිටපතක් බව හෝ එහි සඳහන් කරුණු නිවැරදි බව හෝ ඔප්පු කිරීම අවශ්‍ය නොවිය යුතු ය.

මැනුම් සලකුණු අවහිර කිරීම

**35.** (1) ජලශාස්ත්‍රීය මැනුම් පාලනය කිරීම හෝ මායිම් නිරූපණය කිරීම හෝ අනතුරු හඳුනාගැනීම සඳහා හෝ මේ පනත යටතේ මෙහෙයවනු ලබන යම් මැනුම් කටයුත්තක කාර්ය සඳහා ස්ථානගත කර ඇති හෝ සවිකර ඇති මුහුදේ හෝ වෙරළබඩ ප්‍රදේශයේ යම් ජලශාස්ත්‍රීය මැනුම් සලකුණක් හෝ බෝයාවක් හෝ බීකනවල පිහිටීම හෝ සලකුණු දැනුවත්ව ම හෝ හිතාමතා ම ඉවත් කරන, විනාශ කරන, වෙනස් කරන, යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වරදක් සිදු කරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් මිලියන එකකට නොවැඩි දඩයකට හෝ අවුරුද්දකට නොවැඩි කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වරදකරු කරනු ලැබූ යම් තැනැත්තකු, එකී තැනැත්තා යටත් වන්නා වූ දඩයට, බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම අමතරව, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද එකී මැනුම් සලකුණු, බෝයාවන් හෝ බීකන අලුත්වැඩියා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ යථා තත්ත්වයට පමුණුවීම සම්බන්ධයෙන් කාර්යාලය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වියදම්වලට ද යටත් විය යුතු ය.

යම් ස්ථානයකට ප්‍රවේශ වීම සඳහා බලය

**36.** (1) බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා, කාර්යාලය විසින් හෝ කාර්යාලය විසින් බලය පවරා ඇති යම් තැනැත්තකු විසින් පහත දැක්වෙන දේ සිදු කිරීම නීත්‍යානුකූල වන්නේ ය:-

(අ) යම් ස්ථානයකට, පරිශ්‍රයකට, වාහනයකට, ගුවන් යානයකට හෝ යාත්‍රාවකට ප්‍රවේශය ලබා ගැනීම;

(ආ) ජලශාස්ත්‍රීය මැනුම් කටයුතු සඳහා යම් ස්ථිර ආලෝකයක්, මිනුම් සලකුණක්, විමර්ශන සලකුණක් හෝ යම් තාවකාලික ධජයක්, ලකුණක් හෝ වෙනත් සලකුණක් තැබීම හෝ ක්‍රියාත්මක කිරීම; සහ

(ඇ) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ තහනම් කරනු ලබන්නේ නම් මිස, බීකනයකට, සලකුණකට, ත්‍රිකෝණමිතික ස්ථානයකට, ධජයකට, බෝයාවකට හෝ සංඥාවකට බාධා වන යම් ශාක හෝ සත්ත්ව විශේෂ ඉවත් කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්ය සඳහා -

(අ) සාධාරණ කාලසීමාවක් ඇතුළත, ස්ථානයේ, පරිශ්‍රයේ, වාහනයේ, ගුවන් යානයේ හෝ යාත්‍රාවේ හිමිකරුට, පදිංචිකරුට හෝ එය

සන්තකයේ තබා ගන්නා තැනැත්තාට පූර්ව ලිඛිත දැන්වීමක් දෙනු ලැබිය යුතු ය;

(ආ) හිමිකරුට, පදිංචිකරුට හෝ සන්තකයේ තබා ගන්නා තැනැත්තාට, කාර්යාලය විසින් නිශ්චිතව දක්වනු ලබන ආකාරයට (1) වන උපවගන්තිය යටතේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිරීමේ දී, එකී තැනැත්තාගේ දේපළට සිදුවන යම් හානියක් ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය; හෝ

(ඇ) ජාතික ආරක්ෂාව හේතුවෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ යම් ස්ථානයකට, පරිශ්‍රයකට, වාහනයකට, ගුවන් යානයකට හෝ යාත්‍රාවකට ප්‍රවේශ වීම සීමා කරනු ලැබ ඇත්නම්, අදාළ බලධරයාගේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගනු ලැබිය යුතු ය.

ජලශාස්ත්‍රීය මැනුම් බලඇණියේ යාත්‍රා

**37.** ශ්‍රී ලංකාවේ ජල තීරයන්හි ජලශාස්ත්‍රීය මැනුම් කටයුතු සඳහා භාවිත කරනු ලබන යම් යාත්‍රාවක් සහ යම් යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන උපකරණ, තත්කාර්ය සඳහා සාදන ලද රීතිවලට අනුව කාර්යාලය විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි කාර්යාලය විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

කාර්යාලය විසින් තබා ගනු ලැබිය යුතු ලේඛන

**38.** කාර්යාලය විසින්, මේ පනතේ විධිවිධානවලට සහ ඒ යටතේ සාදන ලද නියෝගවලට අනුකූලව, නියම කරනු ලබන ආකෘතියෙන් සහ ආකාරයෙන් ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයන් සහ නාවික සිතියම් නිර්මාණ ශිල්පීන් පිළිබඳ ලේඛන පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

නිශ්චල මෙන්ම චංචල රජයේ දේපළ කාර්යාලයට ලබාගත හැකි විය යුතු බව

**39.** (1) මේ පනතේ විධිවිධාන ප්‍රකාර, කාර්යාලයේ කාර්ය සඳහා යම් නිශ්චල රජයේ දේපළක් අවශ්‍ය වන අවස්ථාවක දී, එකී කාර්යය, (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ එකී දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදානය කිරීමක් හෝ බදු දීමක් කරනු ලැබීම සඳහා වන කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව එම ආඥාපනතේ විධිවිධාන, එවැනි යම් කාර්යයක් සඳහා කාර්යාලය වෙත එවැනි දේපළක විශේෂ ප්‍රදානය කිරීමක් හෝ බදු දීමක් සඳහා අදාළ විය යුතු ය.

(2) රජයේ දෙපාර්තමේන්තුවක හෝ යම් රජයේ සංස්ථාවක යම් චංචල දේපළක් කාර්යාලයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, එකී චංචල දේපළෙහි සන්තකය සහ භාවිතය කාර්යාලය වෙත පවරනු හෝ පනවනු ලැබිය හැකි ය.

(3) යම් රජයේ දෙපාර්තමේන්තුවක හෝ රජයේ සංස්ථාවක යම් චංචල දේපළකට බලපාන කිසිදු නියමයක්, එම දෙපාර්තමේන්තුව හෝ රජයේ සංස්ථාව පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වයෙන් තොරව, (2) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු නොලැබිය යුතු ය.

නිශ්චිත විධිවිධාන සපයා නොමැති උල්ලංඝනය කිරීම් සඳහා වන දණ්ඩන

**40.** යම් තැනැත්තකු විසින් මේ පනතේ යම් විධිවිධානයක් හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් උල්ලංඝනය කරනු ලබන සහ එකී උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් මේ පනත යටතේ කිසිදු දණ්ඩනයක් නිශ්චිතව දක්වා නොමැති අවස්ථාවක දී, එකී තැනැත්තා, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට දී පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමෙන් පසු, රුපියල් පනස්දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

නඩු පැවරීම සම්බන්ධ විධිවිධානය

**41.** කාර්යාලය විසින් ලිඛිතව බලය පවරා දී ඇති නිලධරයකු, මේ පනත යටතේ වන වැරදි සම්බන්ධයෙන් නඩු කටයුතු පැවරීමේ කාර්ය සඳහා, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136 වන වගන්තියේ අර්ථානුකූලව රජයේ සේවකයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය.

දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව කාර්යාලය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව

**42.** කාර්යාලය, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව වටහා ගනු ලැබිය යුතු ය.

**43.** සභාවේ සියලු සාමාජිකයන්, ජාතික ජලශාස්ත්‍රඥයා සහ කාර්යාලයේ සියලු නිලධරයන් සහ සේවානියුක්තයන් දණ්ඩ නීති සංග්‍රහයේ (19 වන පරිච්ඡේදය) අර්ථානුකූලව සහ කාර්යය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

සාමාජිකයන්, ජාතික ජලශාස්ත්‍රඥයා, කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් රජයේ සේවකයන් වශයෙන් සලකනු ලැබිය යුතු බව

**44.** පනතේ අරමුණු සහ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට, කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට සහ ඉටු කිරීමට අදාළව සාමාන්‍ය විධාන සභාව වෙත නිකුත් කරනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කළ හැකි බව

**45.** වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු අතර, ඒ අනුව මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය.

මේ පනතේ විධිවිධාන වෙනත් ලිඛිත නීතියක් අභිබවා බලපැවැත්විය යුතු බව

**46.** (1) මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යයි නියමිත හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනත මගින් බලය දී ඇති සියලු කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

නියෝග

(2) විශේෂයෙන් සහ (1) වන උපවගන්තියේ අන්තර්ගත විධිවිධානවලට අගතියක් නොමැතිව අමාත්‍යවරයා විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි යः-

(අ) ශ්‍රී ලංකාවේ ජලය සම්බන්ධයෙන් නාවික සිතියම් සකස් කිරීමේ සහ පවත්වා ගැනීමේ ආකාරය සහ ක්‍රමය;

(ආ) ජලශාස්ත්‍රීය සේවාවන්ට අදාළ ජාත්‍යන්තර කාර්යපටිපාටීන් යොදා ගැනීම;

(ඇ) ජලශාස්ත්‍රීය මිනුම් කටයුතු කළ යුතු ආකාරය සහ ජලශාස්ත්‍රීය මිනුම්වලට අදාළ නාවික සිතියම්, දළ සටහන් පත්‍ර, ඩිජිටල් දත්ත සහ වෙනත් වාර්තා සකස් කළ යුතු ආකෘතිය සහ ආකාරය සහ ඒ නාවික සිතියම්, දළ සටහන් පත්‍ර, ක්ෂේත්‍ර පොත් සහ වාර්තාවල ඇතුළත් කළ යුතු විස්තර;

(ඇ) ජලශාස්ත්‍රීය මිනුම්වල දී ලබා ගත යුතු නිරවද්‍යතාවයේ ප්‍රමාණය සහ ඉඩදිය යුතු දෝෂයේ සීමාව;

(ඉ) ජලශාස්ත්‍රීය මිනුම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට සහ අනාවරණය කර ගත හැකි යම් දෝෂ නිවැරදි කිරීම සඳහා ගත යුතු පියවර;

(ඊ) ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරයකු විසින් ඔහුගේ ලියාපදිංචිය අලුත් කිරීමට පෙර ඔහු විසින් ලබා ගත යුතු අධ්‍යයන හා පුහුණු පාඨමාලා;

(උ) ලියාපදිංචි ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරුන් සහ නාවික සිතියම් නිර්මාණ ශිල්පීන් විසින් අනුගමනය කළ යුතු මාර්ගෝපදේශ;

(ඌ) මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචි වීමට අදහස් කරන තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු සුදුසුකම් ලැබීමේ විභාග සහ වෘත්තීය පරීක්ෂණවලට අදාළ ආකෘති පත්‍රය සහ ආකාරය සහ ක්‍රියාපටිපාටිය; සහ

(එ) මේ පනතේ විධිවිධාන යටතේ ලියාපදිංචියක් ලබා ගැනීමට අදහස් කරනු ලබන ඕනෑම තැනැත්තකුට අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සපයන ආයතන ලියාපදිංචි කිරීම.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(4) එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක්, ඒ යටතේ කලින් සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) යම් නියෝගයක් එසේ අනනුමත කළ දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

රීති

**47.** (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව, සභාවට පහත සඳහන් සියලු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි යඃ-

(අ) මේ පනත යටතේ සාදනු ලැබීමට බලය දෙන ලද හෝ නියම කරන ලද රීති සඳහා වන සියලු කාරණා;

(ආ) සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය;

(ඇ) කාර්යාලයේ නිලධරයන් සහ සේවානියුක්තයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම සංග්‍රහය සහ ලියාපදිංචි ජලශාස්ත්‍රීය මිනින්දෝරුවරුන් සහ නාවික සිතියම් නිර්මාණ ශිල්පීන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම සංග්‍රහය; සහ

(ඈ) නිලධරයන් සහ සේවානියුක්තයන් පත් කිරීම, උසස් කිරීම, පාරිශ්‍රමික සහ විනය පාලනය සහ නිලධරයන්ට සහ සේවානියුක්තයන්ට නිවාඩු සහ අනෙකුත් දීමනා ලබා දීම.

(2) කාර්යාලය විසින් සාදන ලද සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කර ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එම පළ කරන ලද දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පරිදි යම් පසු දිනක දී ක්‍රියාත්මකභාවයට එළඹිය යුතු ය.

**48.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතෙහි - (අර්ථ නිරූපණය)

"යාබද කලාපය" යන්නෙන්, දේශීය ජල තීරයේ පළල මනිනු ලබන පාද රේඛාවේ සිට නාවික සැතපුම් විසිහතරක් ඔබ්බට විහිදිය නොහැකි කලාපය අදහස් වේ;

"ඩිජිටල් දත්ත" යන්නෙන්, ජලශාස්ත්‍රීය මිනුමක දී, නාවික සිතියම් නිර්මාණකරණයේ දී හෝ ඒ හා සම්බන්ධ ආනුෂංගික ක්‍රියාවල දී විද්‍යුත් උපකරණ ක්‍රියාත්මක කොට ලබාගන්නා හෝ නිර්මාණය කරනු ලබන තොරතුරු අදහස් වේ;

"සුවිශේෂී ආර්ථික කලාපය" යන්නෙන්, දේශීය ජල තීරයේ පළල මනිනු ලබන පාද රේඛාවේ සිට නාවික සැතපුම් දෙසීයක් ඔබ්බට විහිදිය නොහැකි කලාපය අදහස් වේ;

"දළ සටහන් පත්‍ර" යන්නෙන්, ඩිජිටල් හෝ ග්‍රැෆික් ආකෘතිවල දක්වා ඇති ජලශාස්ත්‍රීය මිනුම් දත්ත අදහස් වේ;

"ජලශාස්ත්‍රීය" යන්නෙන්, මුහුදු ගමනාගමනයේ ආරක්ෂාව වන මූලික අරමුණ සඳහා සහ ආර්ථික වර්ධනය, සුරක්ෂිතතාව සහ ආරක්ෂාව, විද්‍යාත්මක පර්යේෂණ සහ පාරිසරික ආරක්ෂාව ඇතුළුව වෙනත් සියලු සාගර

ක්‍රියාකාරකම්වලට සහාය දැක්වීම සඳහා සාගර, මුහුදු, වෙරළබඩ ප්‍රදේශ, විල් සහ ගංගාවල භෞතික ලක්ෂණ මැනීම සහ විස්තර කිරීම මෙන්ම කාලය සමඟ ඒවායේ සිදුවන වෙනස් වීම් පිළිබඳ අනාවැකි පළ කිරීම සමඟ කටයුතු කරනු ලබන ව්‍යවහාරික විද්‍යාවල ශාඛාව අදහස් වේ;

"ජලශාස්ත්‍රීය සේවා" යන්නට, නාවික සිතියම්, නාවික තොරතුරු දත්ත ගබඩා සහ ජලශාස්ත්‍රීය දත්තවලින් ඇති වන නිෂ්පාදන, නිෂ්පාදනය කිරීම ඇතුළුව අගාධිමිතික, ජලශාස්ත්‍රීය, වෙරළ තීරය, භූමිතික, භූගෝලීය, භූ චුම්භක සහ වඩදිය බාදිය ජල මට්ටම සහ දියවැල් තොරතුරු කළමනාකරණය, නඩත්තු කිරීම, අර්ථ නිරූපණය, සහතික කිරීම සහ බෙදා හැරීම, නාවික තොරතුරු පද්ධති සංවර්ධනය කිරීම සහ ඊට අදාළ ක්‍රියාකාරකම් ඇතුළත් වේ;

"ජලශාස්ත්‍රීය මිනුම්" යන්නෙන්, ජලශාස්ත්‍රීය කටයුතු සිදු කිරීම අදහස් වේ;

"ජලශාස්ත්‍රීය මිනින්දෝරු" යන්නෙන්, ජාත්‍යන්තර සංවිධාන විසින් නියම කර ඇති පරිදි ජාත්‍යන්තර නිපුණතා ප්‍රමිතීන්ට අනුකූලව ජලශාස්ත්‍රීය විද්‍යාව පිළිබඳ අධ්‍යයනය කරන සහ ප්‍රගුණ කරන යම් තැනැත්තකු අදහස් වේ;

"ජල අවකාශීය" යන්නෙන්, ජල අවකාශීය විද්‍යාවන් හෝ පෘථිවි ජලය සහ යාබද කලාපයේ නිශ්චිත ස්ථානයක් සහ වේලාවක් හා සම්බන්ධ අභිධානී දත්ත, තොරතුරු සහ දැනුම අදහස් වේ;

"අභ්‍යන්තර ජලය" යන්නෙන්, දේශීය ජල තීරය මනිනු ලබන පාද රේඛාවෙන් මෙපිට පිහිටි ශ්‍රී ලංකාවට අයත් ගංගා, විල්, පොකුණු සහ ජලාශ ආදිය ඇතුළත් ගොඩබිම තුළ පිහිටි ජලය අදහස් වේ;

"සාගර" යන්නෙන්, නාවික ගමනාගමනයට හෝ නැව්වලට අදාළ ඕනෑම දෙයක් අදහස් වන අතර, ඊට මුහුදට අදාළ හෝ සම්බන්ධ ඕනෑම දෙයක් ඇතුළත් වේ. එමගින් මුහුදේ දී භාවිත කරනු ලබන හෝ භාවිතය සඳහා යොදා ගනු ලබන දේවල් හඳුන්වනු ලැබේ;

"සාගර දත්ත" යන්නෙන්, නාවික ගමනාගමනයට හෝ නැව්වලට අදාළ දත්ත අදහස් වන අතර, ඊට මුහුදට අදාළ හෝ සම්බන්ධ යම් දත්ත ඇතුළත් වේ. එමගින් මුහුදේ දී භාවිත කරනු ලබන හෝ භාවිතය සඳහා යොදා ගනු ලබන දත්ත හඳුන්වනු ලැබේ;

"සාගර භූ අවකාශීය දත්ත" යන්නට, සාගර ගැඹුර, චුම්භක ස්වභාවය, ගුරුත්වාකර්ෂණ වෙනස්කම්, උෂ්ණත්ව හා පීඩන විචල්‍යයන් හමුවේ මුහුදු ජලයේ ශබ්ද තරංග ප්‍රචාරණය, සාගර දියවැල්වල හැසිරීම සහ ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපයේ වඩදිය බාදිය පිළිබඳ සන දත්ත ඇතුළත් වේ;

"සමුද්‍රීය" යන්නෙන්, මුහුදට මායිම් වන, මුහුදට සම්බන්ධ වන හෝ අදාළ වන යන්න අදහස් වේ;

"සමුද්‍රීය කලාපය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 22 දරන සමුද්‍ර කලාප නීතිය යටතේ ප්‍රකාශයට පත් කර ඇති ඕනෑම සමුද්‍ර කලාපයක් අදහස් වන අතර, ඉහත සඳහන් නීතිය ප්‍රකාරව, ප්‍රකාශය මගින් ප්‍රකාශයට පත් කර ඇති-

(අ) යාබද කලාපය;

(ආ) සුවිශේෂී ආර්ථික කලාපය;

(ඇ) මහද්වීපික තටකය; සහ

(ඈ) දූෂණ වැළැක්වීමේ කලාපය,

සහ ඒ නීතිය යටතේ ඉදිරි දිනයක දී ප්‍රකාශයට පත් කළ හැකි වෙනත් යම් කලාපයක් ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ ආරක්ෂක විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"නාවික සිතියම් නිර්මාණකරණය" යන්නෙන්, මනුෂ්‍යයන්ට තීරණ ගැනීමට සහ ඔවුන්ගේ කර්තව්‍ය ඉටු කර ගැනීමට උපකාර වන

පරිගණක දෘඪාංග සහ මෘදුකාංග හරහා ඉලෙක්ට්‍රොනිකව හෝ මුද්‍රිතව නාවික සිතියම් ප්‍රකාශ කිරීමේ කලාව සහ විද්‍යාව අදහස් වේ;

"නාවික සිතියම් නිර්මාණ ශිල්පියා" යන්නෙන්, ජාත්‍යන්තර සංවිධාන විසින් නියම කර ඇති ජාත්‍යන්තර නිපුණතා ප්‍රමිතියට අනුකූලව ඉලෙක්ට්‍රොනික හෝ මුද්‍රිත නාවික සිතියම් ඇඳීමේ සහ නිෂ්පාදනය කිරීමේ නියුතු තැනැත්තා අදහස් වේ;

"නාවික සිතියම්ගත කිරීම" යන්නෙන්, ජල කඳෙහි ඩිජිටල් හෝ මුද්‍රිත සිතියම් සෑදීමේ ක්‍රියාකාරකම හෝ ක්‍රියාවලිය අදහස් වේ;

"නාවික සිතියම" යන්නෙන්, ජලයේ ගැඹුර, පතුලේ ස්වභාවය, උන්නතාංශ, වෙරළ පිහිටන ආකාරය සහ වෙරළෙහි ලක්ෂණ, අවදානම් සහ ගමනාගමනය සඳහා වන ආධාර පෙන්වන්නා වූ සමුද්‍රීය ගමනාගමනයේ අවශ්‍යතාවන් සපුරාලීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද සිතයමක් අදහස් වේ;

"යාත්‍රා කිරීම" යන්නෙන්, යාත්‍රාවක් එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට චලනය කිරීම මෙහෙයවීමේ ක්‍රියාවලිය අදහස් වේ;

"නාවිකයන්ට දැන්වීම්" යන්නෙන්, නාවික සිතියම් සහ ප්‍රකාශනවල නිවැරදි කිරීම් අදහස් වේ. මේවායේ අඩංගු වන්නේ මුහුදේ දී ආරක්ෂාවට අතිශයින් වැදගත් වන තොරතුරු පමණි;

"සාගරය" යන්නෙන්, භූගෝලීය වශයෙන් බෙදී ඇති ප්‍රධාන ප්‍රදේශවලින් එක් වන ප්‍රධාන හෝ මහා මුහුදින් ගොඩබිම වට කර ඇති, ලෝක ගෝලයේ මතුපිට ඇති විශාල ජල කඳ අදහස් වේ;

"දූෂණය වැළැක්වීමේ කලාපය" යන්නෙන්, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය හෝ වෙනත් ඕනෑම සමුද්‍ර කලාපයක, එහි ඉදිරි වෙරළ තීරය සහ ශ්‍රී ලංකාවේ වෙරළබඩ කලාපය තුළ, නැව් ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ වෙරළ ආශ්‍රිත සමුද්‍රීය

ක්‍රියාකාරකම් හේතුවෙන් ඇති වන දූෂණය වැළැක්වීම, අඩු කිරීම, පාලනය සහ කළමනාකරණය කිරීම සඳහා ක්‍රමවත්ව දක්වා ඇති කලාපය අදහස් වේ;

"නියම කරන ලද" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කර ඇති බව අදහස් වේ;

"රජයේ නිලධරයා" යන්නට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ එකී යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"මුහුද" යන්නෙන්, ගොඩබිමට ප්‍රතිවිරුද්ධව පිහිටි සාමාන්‍ය අර්ථයෙන් විශාල ලුණු වතුර ජල කඳ අදහස් වේ;

"දේශීය ජල තීරය" යන්නට, ශ්‍රී ලංකාවේ දේශීය මුහුද සහ ඓතිහාසික ජල තීරය ඇතුළත් වේ;

"ශ්‍රී ලංකාවේ ජලය" යන්නට, ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර ජලය සහ දේශීය ජල තීරය ඇතුළත් වේ.

**49.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.